# ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

## ග්‍රාමීය සංවර්ධන ඩිප්ලෝමා පාඨමාලාව - 2022/2023

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ භූගෝල විද්‍යා අධ්‍යයනාංශය මගින් පවත්වනු ලබන ග්‍රාමීය සංවර්ධන ඩිප්ලෝමා පාඨමාලාව සඳහා 2022/2023 අධ්‍යයන වර්ෂයට පහත සඳහන් සුදුසුකම්ලත් අයගෙන් 2022/10/30 දිනට පෙර අයදුම් පත් කැඳවනු ලැබේ.

### ග්‍රාමීය සංවර්ධන ඩිප්ලෝමා පාඨමාලාව

01. අ.පො.ස. (උ.පෙළ) පරීක්ෂණයෙන් විෂයන් 02 කින් සමත්වීම

හෝ

අ.පො.ස (සා.පෙළ) පරීක්ෂණයෙන් සිංහල භාෂාව ඇතුළුව විෂයන් 06 කින් සමත්වීම සහ ග්‍රාම සංවර්ධන ක්ෂේත්‍රයේ වසර 4 ට නොඅඩු පළපුරුද්දක් තිබීම.

02. පාඨමාලා ගාස්තුව රු 50,000/=

| | | |
|---|---|---|
| කාලය | : | එක් අවුරුදු පාඨමාලාවකි (NVQ Level 5/SLQF Level 3) |
| දේශන | : | සෙනසුරාදා දිනවල පෙ.ව 8.00 සිට ප.ව 5.00 දක්වා පැවැත්වේ. |
| මාධ්‍යය | : | සිංහල |

03. මෙම ඩිප්ලෝමා පාඨමාලාව සමත්වීම, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය මගින් මෙහෙයවනු ලබන තුන් අවුරුදු සමාජීය විද්‍යාවේදී පාරිසරික හා සංවර්ධන අධ්‍යයන සාමාන්‍ය (බාහිර) උපාධි පාඨමාලාව සඳහා අයදුම් කිරීමට සුදුසුකමක් වේ.

04. මෙම පාඨමාලාවට ශ්‍රී ලංකාවේ විවිධ පළාත්වල මෙන්ම ආසියානු කලාපයේ රටවල ග්‍රාමීය සංවර්ධනය ආශ්‍රිත අත්දැකීම් ලබා ගැනීම සඳහා අවශ්‍ය ක්ෂේත්‍රීය අධ්‍යයනද ඇතුලත් වේ.

05.අයදුම්පත සහ පාඨමාලාව පිළිබඳ විස්තර පහත වෙබ් අඩවි වලින් ලබාගත හැකිය.

www.sjp.ac.lk

www.fhss.sjp.ac.lk

www.fhss.sjp.ac.lk/geog

අදාල අයදුම්පත සමඟ ගංගොඩවිල මහජන බැංකු ශාඛාවේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර සහ සමාජීය විද්‍යා පීඨයේ ගිණුම් අංක 013010001371 ට බැරවන පරිදි රු 1000 ක මුදලක් ගෙවා ලබා ගත් රිසිට්පත **පාඨමාලා සමායෝජක, ග්‍රාමීය සංවර්ධන ඩිප්ලෝමා පාඨමාලාව, භූගෝල විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ගංගොඩවිල, නුගේගොඩ** යන ලිපිනයට එවන්න. සම්පූර්ණ අයදුම්පතෙහි පිටපතක් ස්කෑන් කර පහත විද්‍යුත් තැපැල් ලිපිනයන් වෙත යොමු කරන්න.

06. පාඨමාලාව සඳහා ලියාපදිංචි වීමේදී මුළු පාඨමාලා ගාස්තුවෙන් 50% ක් පමණක් ගෙවා ඉතිරිය මාස හයක් ඇතුළත ගෙවිය හැකිය.


විමසීම් :- මහාචාර්ය සුනේත්‍රා තෙන්නකෝන් මිය
පාඨමාලා සමායෝජක
භූගෝල විද්‍යා අධ්‍යයනාංශය
දු.අ. - 0112802028/ 0112758769/0112758751
E-mail – ruraldiploma@gmail.com
sunethrapk@sjp.ac.lk


ලේඛකාධිකාරී

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
ගංගොඩවිල
නුගේගොඩ.
2022.10.30